ලංකා සතොස ලිමිටඩ් සමාගමේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2023

ලංකා සතොස ලිමිටඩ් සමාගමේ ("සමාගම") 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයෙහි මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් විසින්ම එම අස්ථිත්වය සම්බන්ධ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්වල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමග ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2023 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.2 වත්කම් , වගකීම්, ආදායම් හා වියදම්

සමාගම විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන අයිතමය	**වටිනාකම** **රු.**
වත්කම්	
ජංගම නොවන වත්කම්	1,342,493,078
ජංගම වත්කම්	10,832,852,647

මුළු වත්කම්	**12,175,345,725**
	===========

ස්කන්ධය හා වගකීම්	
ස්කන්ධය	(12,609,839,767)
<u>වගකීම්</u>	
ජංගම නොවන වගකීම්	7,004,439,540
ජංගම වගකීම්	17,780,745,952

මුළු වගකීම්	24,785,185,492

මුළු ස්කන්ධය හා බැරකම්	**12,175,345,725**
	===========
මුළු ආදායම	57,545,655,142
මුළු වියදම	57,581,079,656

අතිරික්තය/(ඌනතාවය)	**(35,424,514)**
	===========

ඉහත සඳහන් තොරතුරු අනුව සමාගමේ 2022 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම් රු.12,175,345,725 ක් හා මුළු වගකීම් රු.24,785,185,492 ක් වූයෙන් මුළු වත්කම් ඉක්ම වූ මුළු වගකීම් රු.12,609,839,767 ක් වීමෙන් අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත තත්වයක් පැවතුණි.

3. විගණන නිරීක්ෂණ

3.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමුපකාර තොග වෙළඳ සංස්ථාවෙන් 2005 වසරේදී පවරාගත් රු.3,642,843ක් වූ සන්නිවේදන උපකරණ සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ අතර ස්ථාවර වත්කම් ලේඛණයේ ද සටහන් කර නොතිබුණි.	සංස්ථාවෙන් 2005 දි පවරා ගත් සන්නිවේදන උපකරණ සම්බන්ධව කිසිදු සාක්ෂියක් සොයා ගැනිමට නොහැකි වූ අතර ඉදිරියේදී සමස්ථ ස්ථාවර වත්කම් වල සත්‍යාපනයක් කර ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර යාවත්කාලින කිරීමට කටයුතු කෙරේ.	ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදිව හා යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කල යුතු අතර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගැනීමට වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය.

(ආ) ආයතනයේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා පාලන කමිටු ස්ථාපිත කර තිබූ අතර, ඒවායේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.	එකඟ වේ. මේ සම්බන්ධයෙන් තොරතුරු ඉදිරියේදී ඉදිරිපත් කෙරෙනු ඇත.	කාර්යසාධනය ඇගයීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය.

3.2 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 8(2)(අ)(ii) වගන්තිය හා 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 16(i)වගන්තිය	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමාගමේ අලෙවිසැල්වල සේවය කරනු ලබන දෛනික වැටුප් ගෙවන සේවකයින් 573 දෙනෙකු සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා ලියාපදිංචි කර දායක මුදල් ගෙවා නොතිබුණි.	සමාගමේ ස්ථිර සහ කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සියලුම සේවකයින් සඳහා නියමිත පරිදි EPF හා ETF ගෙවනු ලැබේ.	දෛනිකව වැටුප් ගෙවන සේවකයින් පනත් ප්‍රකාරව අරමුදල් සඳහා ලියාපදිංචි කර දායක මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය.
(ආ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙන් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොත			
	(i) 3.2 ඡේදය	කළමනාකරණ සේවා අනුමැතියෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සමාලෝචිත වර්ෂය තුල නිළධාරීන් 10 දෙනෙකුට එකතුව රු.2,500,000 ක් අන්තර් දීමනා ලෙසද ප්‍රධාන විධායක නිලධාරීට සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් 05 දෙනෙකුට මසකට රු. 75,000 බැගින් එකතුව රු.3,292,500 ක් කාර්යයසාධන දීමනා ලෙසද ගෙවා තිබුණි.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොමැති අතර අධක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන අදාල ගෙවීම් සිදුකර ඇත.	චක්‍රලේඛය ප්‍රකාරව දීමනා ගෙවීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය.

	(ii)3.5 ඡේදය	අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව සමාගමේ නිලධාරිනියක් 2022 මැයි 23 දින සිට තාවකාලිකව රේඛීය අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර තිබූ අතර එදින සිට විගණිත දිනය වූ 2024 මාර්තු 31 දින දක්වා වැටුප් හා දීමනා ලෙස රු.2,536,254 ක් ගෙවා තිබුණු අතර එම මුදල අමාත්‍යාංශයෙන් අයකරගෙන නොතිබුණි.	මෙම නිලධාරිනිය 2024 සැප්තැම්බර් 22 දින සිට නැවත සමාගම වෙත වාර්තා කර ඇත. ඉදිරියේදි කැබිනට් අනුමැතියකින් තොරව වෙනත් ආයතනයකට සේවකයින් නිදහස් නොකිරිමට කටයුතු කරනු ලැබේ.	වෙනත් ආයතන වලට නිලධාරීන් අනුයුක්ත කිරීමේදී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ගෙවන ලද වැටුප් හා දීමනා අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙන් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යවසායන්ගේ සංයුක්ත පාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ඡේදය	පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, හා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අදාළ වර්ෂය ආරම්භ වීමට දින 15කට පෙර භාණ්ඩාගාරයට ඉදිරිපත් කල යුතු වුවද 2023 වර්ෂයට අදාළ එම සැලසුම් මාර්ගෝපදේශයේ විධිවිධාන ප්‍රකාරව සකස් කර භාණ්ඩාගාරයට ඉදිරිපත් කර නොතිබුණි.	එකඟ වේ. 2025 වර්ෂය සඳහා උපාය මාර්ගික සැලැස්ම, වාර්ෂික ක්‍රියාමාර්ග සැලැස්ම සහ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සකසමින් පවතින අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් අනතුරුව භාණ්ඩාගාරයට ඉදිරිපත් කෙරෙනු ඇත.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව උපායමාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය සකස් කර භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	2015 මැයි 25 දිනැති අංක පීඊඩී 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	රාජකාරී හා පෞද්ගලික පරිහරණය සඳහා නිල වාහන භාවිතා කිරීම හෝ නිල වාහන භාවිතා කිරීම වෙනුවට ප්‍රවාහන දීමනාව ලබා ගැනීමට හිමිකමක් නොමැති MM 1-1 ගණයේ තනතුරු දරන නිලධාරීන් 19 දෙනෙකුට 2023 වර්ෂය තුලදී ප්‍රවාහන දීමනා ලෙස රු.2,807,083 ක මුදලක් ගෙවා තිබුණි.	2010 වසරේ MM 1-1 වැටුප් කේතය යටතේ සේවය කළ නිළධාරීන් දෙදෙනෙකු සඳහා ප්‍රවාහන දිමනාව ලෙස රු.12,500 ක් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර ඇත.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ප්‍රවාහන දීමනා ගෙවිය යුතු අතර ප්‍රවාහන දීමනා හිමි නොමැති නිලධාරීන්ට ගෙවීම් කළ මුදල් අයකරගත යුතුය.
(ඉ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 6.2 හා 6.4 ඡේද	සමාගම විසින් පවත්වාගෙන යන රටබීම අලෙවිසැල් බලපත්‍ර ලබාගැනීම සඳහා උපදේශකයෙකු පත්කර තිබුණි. චක්‍රලේඛය ප්‍රකාරව මෙවැනි සේවයක් දින 90ක් නොඉක්මවන කෙටිකාලීන පදනමක් මත හදිසි සේවයක් ලෙස ලබා ගත යුතු අතර රු. 150,000 ක් වූ උපරිම දීමනාව අදාල කාර්යය නිම වූ පසු අමාත්‍යාංශ ලේකම්ගේ පෞද්ගලික අනුමැතිය මත ගෙවිය යුතුය. එසේ වුවද චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මාසිකව රු.100,000ක දීමනාවක්ද අනියම් දීමනා	මෙම උපදේශකවරයා සේවයෙන් ඉල්ලා අස්වී ඇති අතර ඉදිරියේදි උපදේශකවරුන් බඳවා ගනු ලබන්නේ රාජ්‍ය මුදල් චක්‍රලේඛ වලට අනුකූලවය.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව උපදේශකයන් පත්කිරීම හා ගෙවීම් කිරීම සිදුකළ යුතුය.

		සහ ලබාගන්නා මත්පැන් අලෙවි බලපත්‍රයක් සඳහා රු.25,000 ක දීමනාවක්ද භාණ්ඩාගාර අනුමැතියකින් තොරව එම උපදේශකවරයාට ගෙවා තිබුණි. ඒ අනුව චක්‍රලේඛ විධානයන්ට පටහැනිව 2022 ජූනි සිට 2024 මැයි දක්වා රු.3,496,789 ක මුදලක් ගෙවා තිබුණි. තවද මෙම උපදේශකවරයාගේ සේවය අවස්ථා 6කදී දීර්ඝ කර තිබූ අතර ඒ සඳහාද භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.		
(ඊ)	2017 ඔක්තෝබර් 25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2017	රාජ්‍ය සමාගම්වල ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ට ගෙවිය යුතු මාසික වෘත්තීය දීමනාව සේවා කාලය මත පදනම්ව ගෙවිය යුතු වුවද එම සීමාවන්ට පටහැනිව රු.10,000 ක මාසික දීමනාවක් ගෙවීම නිසා නිලධාරීන් 06 දෙනෙකුට 2023 වර්ෂය තුල රු.493,367ක් වැඩිපුර ගෙවා තිබුණි.	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පදනම්ව ගෙවීම් සිදුකර ඇත.	චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව වෘත්තීය දීමනාව ගෙවිය යුතු අතර වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුය
(උ)	2017 මැයි 16 දිනැති අංක DMS/1741 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය	ප්‍රධාන විධායක නිලධාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සඳහා අනුමත මාසික දීමනාව පිළිවෙළින් රු. 95,000 ක් සහ රු.90,000 ක් වුවද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ප්‍රධාන විධායක නිලධාරීට රු.250,000ක හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීට රු.150,000ක මාසික දීමනාවක් ගෙවා තිබුණි. ඒ අනුව 2023 වර්ෂයේදී ප්‍රධාන විධායක නිලධාරීට සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීට වැඩිපුර ගෙවා තිබූ මුදල පිළිවෙළින් රු.1,860,000 ක් හා රු.2,094,400 ක් විය.	පවරා ඇති රාජකාරී මත පදනම්ව එළඹෙන තීරණ හා ආවේනික වන වගකීම්වලට සරිලන වැටුප් පරිමාණයක් ලබා දිය යුතු බව තීරණය කරමින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ සහ විධායක නිළධාරීගේ මූලික වැටුප පිළිවෙළින් රු.150,000 සහ රු.250,000 දක්වා ඉහළ නැංවීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමත දීමනා පමණක් ගෙවීය යුතුය. වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 ආර්ථික නොවන ගනුදෙනු

විගණන නිරීක්ෂණය	කළමණාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රධාන කාර්යාලයේ 200 කට අධික ස්ථාවර දුරකථන සම්බන්ධතා අතරින් 175 කට වැඩි දුරකථන සම්බන්ධතා සංඛ්‍යාවක් ක්‍රියාකාරි තත්ත්වයේ නොතිබූ අතර 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට දුරකථන ගාස්තු	2025 ජනවාරි මාසයේදී මේ සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.	අක්‍රිය දුරකථන සබඳතා ක්‍රියාකාරී කර ගැනීමට හෝ විසන්ධි කරවා ගැනීමට කටයුතු කල යුතුය.

වශයෙන් රු.10,588,673ක් ගෙවා තිබුණි. එහිදී අක්‍රිය දුරකථන සබඳතා විසන්ධි කර ගැනීමට හෝ වෙනත් විකල්පයකට යොමු වීමට කටයුතු කර නොතිබුණි.		

4.2 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සමාගමේ ඒකාබද්ධ ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP system) පුළුල් කිරීම සඳහා පුද්ගලික ආයතනයක් තෝරාගෙන 2021 වර්ෂයේදී රු. මිලියන 201 ක් වැයකර තිබුණි. මෙම ප්‍රසම්පාදන කාර්යයට අදාලව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබූ අතර ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කිරීමේදී ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනයේ (ICTA) අවසාන පද්ධති විගණනය සහ පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණය විගණිත දිනය වූ 2024 මැයි 7 දින වන විටත් සිදුකර නොතිබුණි. තවද ගිවිසුම ප්‍රකාරව වගකීම් කාලය අවසන් වීමෙන් පසු පද්ධතිය සමාගම වෙත පවරාගෙන නොතිබියදී 2023 වර්ෂයේ පද්ධතියේ නඩත්තු වියදම ලෙස රු.30,559,286 ක මුදලක් ගෙවා තිබුණි. තවද මෙම පද්ධතිය හරහා සමාගමේ වැටුප් කළමනාකරණය හා අයවැයකරණය යන කාර්යයන් ඉටු කරගත නොහැකි බවද නිරීක්ෂණය විය.	ඉදිරි කාලපරිච්ඡේදයේ අවසාන පද්ධති විගණනය සහ පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණ පවත්වා කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු 10% ක රඳවා ගැනීම් මුදල නිදහස් කරනු ලැබේ. ERP පද්ධතිය සමාගමේ තොරතුරු තාක්ෂණ අංශයට පවරා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. ICTA භාර දුන් නමුත් වැටුප් කළමනාකරණය හා අයවැයකරණය කළ නොහැකි බව දන්වා ඇත.	ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර සමාගමේ අවශ්‍යතාව තීරණය කර ශක්‍යතා අධ්‍යයනයක්ද සිදු කළ යුතුය. පද්ධතිය සමාගමට පවරා ගැනීමට හා පද්ධති විගණනය සිදු කර ගැනීමට කටයුතු කල යුතු අතර වැටුප් කළමනාකරණය, අයවැයකරණය යන කාර්යයන්ද ඉටු කරවා ගැනීමට හැකිවන ලෙස පද්ධතිය සකස් කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ) ඉහත නව පද්ධතිය ස්ථාපිත කිරීම ආරම්භ කරන අවස්ථාවේදී පැවති පද්ධතිය ස්ථාපනය කළ කොන්ත්‍රාත්කරු වෙත රු.83,000,000 ක් ගෙවා වැඩ අවසන් කිරීමේ වාර්තාවකින් තොරව, කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. කොන්ත්‍රාත්තුව නොදන්වා අවසන් කිරීම සම්බන්ධයෙන් පැරණි කොන්ත්‍රාත්කරු විසින් සමාගමට විරුද්ධව ගොනු කර ඇති නඩුව සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.7,656,904 ක මුදලක් වැයකර තිබුණි.	මේ සම්බන්ධයෙන් SOFT WATCH ආයතනය විසින් ලබා දී තිබූ රු.19,817,578 ක් වූ කාර්යසාධන සුරක්ෂණය, චෙක්පත් අංක 471504 මගින් ලබා ගැනීමට කටයුතු කර ඇති අතර එමගින් ආයතනය සිදු වූ පාඩුව අවම කර ගැනීමට කටයුතු කර ඇත.	කොන්ත්‍රාත්තුව අවසන් කිරීම නොසැලකිල්ලෙන් සිදුකර ඇතිබව පෙනීයන බැවින් එමඟින් සමාගමට සිදු වී ඇති පාඩුව වගකිවයුතු පාර්ශව වෙතින් අයකර ගැනීමට කටයුතු කල යුතුය.

(ඇ) විකුණුම් ප්‍රවර්ධන වැඩසටහනක් වෙනුවෙන් තෑගි ලබාදීමට සහ ආයතනයේ සේවකයන්ට ලබාදීම සඳහා රු. 5,112,850 ක් වැය කර ජංගම දුරකථන 315 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) පරිදි මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙළ කර නොතිබූ අතර 2.3.2 (ඇ) අනුව පිරිවිතර ඇතුළු ලංසු ලේඛන සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි. තවද 5.3.11 හා 5.4.8 මාර්ගෝපදේශ පරිදි ලංසු කැඳවීමේ ලේඛන වල ලංසු සුරක්ෂණය සහ කාර්යසාධන සුරක්ෂණය පිළිබඳ දක්වා නොතිබුණු අතර 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව සැපයුම්කරු සමඟ විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹී නොතිබුණි.	මෙම ප්‍රසම්පාදනය සිදු කිරීම සඳහා කරනු ලැබූ ඉල්ලීමත් සමග දුරකථන මාදිලි 02 සඳහා වන ඇස්තමේන්තුගත මිල සඳහන් කර ඇත. දැනට ප්‍රසම්පාදනයන් අවම කාල සීමාවක් යටතේ සිදුකළ යුතු බැවින් තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් ලංසු ලේඛන අනුමත කිරීම සිදුකරනු ලබන්නේ ජාතික තරගකාරී ලංසු කැඳවීම යටතේ කැඳවන ප්‍රසම්පාදනයන් සඳහා පමණි. මෙම ප්‍රසම්පාදනය සඳහා සැපයුම්කරුවන් සමඟ කොන්ත්‍රාත් ගිවිසුම් වලට එළඹී නොමැත. වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය යටතේ කැඳවනු ලැබූ ප්‍රසම්පාදනයන් සඳහා ලංසු සුරක්ෂණ හෝ කාර්ය සාධන සුරක්ෂිතයන් ලබා ගැනීමක් සිදු කර නොමැත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු නොකළ නිලධාරීන්ට විරුද්ධව පියවර ගත යුතුය.
(ඈ) සමාගමේ කොට්ටාව මෙගා අලෙවිසැල සඳහා සුපිරි වෙළෙඳසැල් බාස්කට් සහ රාක්ක සැපයීම සහ ස්ථාපනය කිරීමේ ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.6.1 (අ) (ii) හා (iv) ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිරිවිතර හා ලංසු ලේඛන සමාලෝචනය කර අනුමත කර නොතිබුණි.	මෙම ප්‍රසම්පාදනය සඳහා ඉල්ලීම සිදුකරනු ලබන අංශය විසින් අදාල තාක්ෂණික දැනුම සහිත නිලධාරියකු මඟින් තහවුරු කරන ලද පිරිවිතරයන් ප්‍රධාන විධායක නිලධාරීගේ අනුමැතිය සහිතව ලබා දී ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු නොකළ නිලධාරීන්ට විරුද්ධව පියවර ගත යුතුය.
(ඉ) සමාගම විසින් රු.2,354,000 ක මුදලකට ලැප්ටොප් 15 ක් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.3.1 (අ) ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස්කර හා 2.11.1 (ඇ) ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රමවේදය තීරණයකර නොතිබූ අතර 5.3.11 සහ 5.4.8 ඡේද ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛනවල ලංසු සුරක්ෂණය සහ කාර්යයසාධන සුරක්ෂණය පිළිබඳ තොරතුරු සඳහන් කර නොතිබුණි. එසේම මාර්ගෝපදේශ 8.9.1 ප්‍රකාරව කොන්ත්‍රාත්කරු සමඟ විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ ද නොතිබුණි.	වර්ෂ ආරම්භ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් නොවූ සෑම ප්‍රසම්පාදනයක් සඳහාම ඇස්තමේන්තු වටිනාකමක් සකස්කර ඒ සඳහා ප්‍රධාන විධායක නිලධාරීන්ගේ අනුමැතිය ලබා ගැනීම සිදු කරන අතර සමාගමේ දෛනික මෙහෙයුම් කටයුතුවලට අවශ්‍ය කරන හදිසි අවශ්‍යතාවන්ට ස්ථාවර භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ දී ප්‍රසම්පාදනයේ විනිවිධභාවයට හානියක් නොවන පරිදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 හි සීමාවන්ට යටත්ව ප්‍රසම්පාදනයේ ස්වභාවය අනුව ප්‍රසම්පාදන ක්‍රමය තීරණය වේ. වෙළඳපොල මිල සැදහුම් ක්‍රමය යටතේ කැඳවනු ලැබූ ප්‍රසම්පාදනය සඳහා ලංසු සුරක්ෂණ හා කාර්යසාධන සුරක්ෂණ ලබාගෙන නොමැති අතර මේ වන විට රු.මිලියන 05 ට වැඩි සෑම ප්‍රසම්පාදනයක් සඳහාම කාර්යසාධන	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු නොකළ නිලධාරීන්ට විරුද්ධව පියවර ගත යුතුය.

	සුරක්ෂණයක් ලබාගැනීමට කටයුතු කරනු ලබයි. තවද, මෙම ප්‍රසම්පාදනයට අදාලව කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹී නැත.	
(ඊ) රු.1,480,000 කට Island Frezer set & bottle cooler මිලදී ගැනීමේදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2 (ඇ) ඡේදය ප්‍රකාරව පිරිවිතර ඇතුළු ලංසු ලේඛන තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අනුමතකර හා 5.3.11 සහ 5.4.8 ඡේද ප්‍රකාරව ලංසු ඇගයීමේ ලේඛනවල ලංසු සුරක්ෂණය සහ කාර්යසාධන සුරක්ෂණය පිළිබඳ තොරතුරු සඳහන්කර නොතිබුණි. තවද 8.9.1 ප්‍රකාරව කොන්ත්‍රාත්කරු සමඟ විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි.	ප්‍රසම්පාදන ඉල්ලීම කරන ලද අංශයේ තාක්ෂණික දැනුම ඇති නිලධාරියෙකු විසින් තහවුරු කරන ලද පිරිවිතරයක් සහිතව ප්‍රධාන විධායක නිලධාරීන්ගේ අනුමැතිය මත අවම කාලසීමාවක් යටතේ ප්‍රසම්පාදනය කල යුතු බැවින් තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ කැඳවන ප්‍රසම්පාදන පමණක් ඉදිරිපත් කරන අතර ඉදිරියේ දී සෑම ප්‍රසම්පාදනයක්ම තාක්ෂණික ඇගයීම් කමිටුවට යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. වෙළඳපෙලෙ මිල සැඳහුම් ක්‍රමය යටතේ කැඳවනු ලැබූ ප්‍රසම්පාදනය සඳහා ලංසු සුරක්ෂණ හා කාර්යසාධන සුරක්ෂණ ලබාගෙන නොමැති අතර මේ වන විට රු. මිලියන 05 ට වැඩි සෑම ප්‍රසම්පාදනයක් සඳහාම කාර්යසාධන සුරක්ෂණයක් ලබාගැනීමට කටයුතු කරනු ලබයි. තවද, මෙම ප්‍රසම්පාදනයට අදාලව කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹී නැත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු නොකළ නිලධාරීන්ට විරුද්ධව පියවර ගත යුතුය.
(උ) රු.5,058,500 කට උපකරණ මිලදී ගැනීමට අදාල ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.1 (ඇ) ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රමවේදය තීරණයකර හා 2.3.2 (ඇ) ප්‍රකාරව පිරිවිතර ඇතුළු ලංසු ලේඛන තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අනුමතකර නොතිබූ අතර 5.3.11 සහ 5.4.8 ඡේද ප්‍රකාරව ලංසු ඇගයීමේ ලේඛණවල ලංසු සුරක්ෂණය සහ කාර්යසාධන සුරක්ෂණය පිළිබඳ සඳහන්කර නොතිබුණි.	වෙළඳපොල මිල සැඳැහුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවනු ලැබූ ප්‍රසම්පාදනයන් සඳහා ලංසු සුරක්ෂණ හෝ කාර්යය සාධන සුරක්ෂිතයන් ලබා ගැනීමක් සිදු කර නොමැත. නමුත්, මේ වන විට රු. මිලියන 05 ට වැඩි සෑම ප්‍රසම්පාදනයක් සඳහාම කාර්යසාධන සුරකෂණයක් ලබා ගැනීමට කටයුතු කරනු ලබයි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු නොකළ නිලධාරීන්ට විරුද්ධව පියවර ගත යුතුය.
(ඌ) 2019 වර්ෂයේදී ලංකා සතොස අලෙවිසැල් 08 ක් සඳහා වායුසමීකරණ යන්ත්‍ර සැපයීම හා සවිකිරීම සඳහා වූ ප්‍රසම්පාදනය සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු පුද්ගලික සමාගමට ලබා දී තිබුණි. එම සමාගම විසින් 2023 අගෝස්තු 14 දින රු. 9,017,581 ක් වටිනා ඉන්වොයිස් පත්‍ර 08ක් ඉදිරිපත් කර තිබුණ ද සමාගමේ ඉංජිනේරු අංශය විසින් ප්‍රසම්පාදනයට අදාළව	දැනට මේ සම්බන්ධව විමසීම සඳහා සතොස ඉදිකිරීම් හා ඉංජනේරු පුද්ගලික සමාගමේ නිළධාරීන් නොමැති බැවින් නව නිළධාරීන් පිරිසක් පත් කල පසු මේ සම්බන්ධව විමසා පිළිතුරු ඉදිරිපත් කෙරෙනු ඇත.	ප්‍රසම්පාදනයට අදාළ ලිපිලේඛන විධිමත්ව නඩත්තු කළ යුතු අතර මිලදීගත් වත්කම් නියමිත පරිදි ගිණුම්ගත කළ යුතුය.

නඩත්තු කර තිබුණු ගොනුවේ ප්‍රසම්පාදනයට අදාළ කිසිදු ලේඛනයක් ඇතුළත්ව නොතිබුණි. තවද එම ඉන්වොයිස් පත්‍ර අනුව සතොස අලෙවිසැල් 08හිම විකුණුම් කළමනාකරුවන් විසින් වායුසමීකරණ යන්ත්‍ර හොඳ තත්වයෙන් භාරගත් බවටත් එය තොග පොත්වල ඇතුළත් කළ බවටත් තොග කුවිතාන්සි නිකුත් කර තිබුණ ද විගණිත දිනය වූ 2024 ජූනි 10 දක්වා ඒවා ගිණුම්ගතකර නොතිබුණි.		ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු නොකළ නිලධාරීන්ට විරුද්ධව පියවර ගත යුතුය.

4.3 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමණාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සමාගමේ අලෙවිසැල් සඳහා 3,836 ක කාර්යය මණ්ඩලයක් අනුමතකර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වනවිට අලෙවිසැල් කළමනාකරු, සහකාර අලෙවිසැල් කළමනාකරු, ජොෂ්ඨ විකුණුම් සහායක සහ ගබඩා සහායක යන තනතුරු 4 ට අදාලව පුරප්පාඩු 726 ක් පැවතුණි.	2020 වර්ෂයේ කොවිඩ් වසංගතය හේතුවෙන් සේවය හැරයාම වැඩිවීමත්, බඳවාගැනීම් තාවකාලිකව අත්හිටුවා තිබීමත් හේතු වී ඇත.	පුරප්පාඩු තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීමට කටයුතු කල යුතුය.
(ආ)2023 වර්ෂය අවසානයේදී සමාගම විසින් සේවකයින් 573 දෙනෙකු දෛනික වැටුප් ගෙවීමේ පදනම මත අලෙවිසැල් සඳහා බඳවාගෙන තිබුණි. මෙම සේවකයින්ගේ පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මඟින් සටහන් කර නොතිබූ අතර අත්සන් ලේඛනයක් මත පදනම්ව 2023 වර්ෂයෙ දී රු.349,041,862 ක් වැටුප් ගෙවා තිබුණි.	2021 දී නව අලෙවිසැල් 20 ක් පමණ විවෘත වීමත් සෑම වසරකම නව අලෙවිසැල් 10 ඉක්මවූ සංඛ්‍යාවක් විවෘත වීමත් හේතුවෙන් සේවා අවශ්‍යතාවය මත සේවකයින් බඳවාගන්නා ලදී. 2022 වසරේ දෛනික ගෙවීම් පදනම මත යොදවා ගත් සේවකයන් වෙනුවෙන් දැරූ පිරිවැයට සාපේක්ෂව 2023 වසරේ දරා ඇති පිරිවැය අඩුවී ඇත. දෛනික වැටුප් ගෙවීමේ පදනම මත බඳවා ගන්නා සේවකයින් දිගින් දිගටම සේවයේ නිරත නොවන බැවින් පැමිණීම සහ පිටවීම තහවුරු කර ගැනීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් සිදු කර ගැනීම අපහසු කටයුත්තක් බැවින් පැමිණීමේ පිටවීමේ අත්සන් ලේඛණයක් මගින් පැමිණීම පිටවීම තහවුරු කර ගනු ලැබේ.	සියළු සේවකයින් සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් පැමිණීම් පිටවීම් සටහන් කිරීමට කටයුතු කල යුතුය.
(ඇ) අලෙවිකරණ හා මාර්ගගත වෙළදාම් පිළිබඳ ප්‍රධානි (Head of Marketing & Online Trading) සහ රහස්‍ය ලේකම් යන තනතුරු දෙක සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව නිලධාරීන් දෙදෙනෙකු කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබූ අතර බඳවාගත් දින සිට 2023	මෙම තනතුරු දෙකෙහි පුරප්පාඩු පැවති බැවින් අධ්‍යක්ෂක මණ්ඩලයේ පූර්ව අනුමැතියට යටත්ව කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇත. මෙම තනතුරු දෙකම සේවා අවශ්‍යතාවය මත ඇතිවූ පුරප්පාඩු වලට අදාළ සිදු කළ බඳවාගැනීම් වන අතර අධ්‍යක්ෂක මණ්ඩල	බඳවා ගැනීම සිදුකල යුත්තේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව පමණි.

දෙසැම්බර් 31 දින දක්වා වැටුප් හා දීමනා ලෙස එම නිලධාරීන් දෙදෙනාට එකතුව රු. 7,188,333 ක් ගෙවා තිබුණි.	තීරණය මත කොන්ත්‍රාත් කාලය අවසන් වීමත් සමඟ තනතුරු අහෝසි වී යාමට නියමිතය.	
(ඈ) 2023 දෙසැම්බර් 31 දිනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද තනතුරු 20 කට අදාලව පුරප්පාඩු 852 ක් පැවතියද විකුණුම් සහායක තනතුරේ 281ක සේවක අතිරික්තයක් පැවතුණි. මෙම අතිරික්ත සේවකයින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව බඳවාගෙන තිබුණි.	2017 වසරේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අලෙවිසැල් 400 සඳහා විකුණුම් සහායක තනතුරට අනුමත කාර්ය මණ්ඩලය ලෙස 1149 ක් අනුමත කර ඇත. නමුත් 2017.12.31 වන විට මෙම තනතුර යටතේ 1746 සේවක පිරිසක් සේවය කර ඇත. තවද 2018/2019 කාලසීමාව තුළ ගබඩා සහායක තනතුරේ සිට වෙළඳ සහායක තනතුරට 160 කට ආසන්න පිරිසක් සේවය උසස් කර ඇත. 2023 වසරේ අප්‍රේල් සිට අලෙවිසැල් හී ප්‍රාථමික සේවා ගණනයේ තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරිමට අනුමැතිය කළමනාකරන සේවා දෙපාර්තමේන්තුව මඟින් ලබාදී ඇත. විකුණුම්/ වෙළඳ සහායක කාණ්ඩයේ සේවක අතිරික්තය අවම කර ගැනීමට 2024 ජුලි 01 සිට ජොෂ්ඨ විකුණුම් සහායක තනතුරට සේවකයින් 223 දෙනෙකු සඳහා උසස්වීම් ලබා දී ඇත.	අතිරික්ත සේවකයින් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය.
(ඉ) 2021 පෙබරවාරි 05 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවාගැනීමේ පටිපාටිය අනුව එක් එක් තනතුරු සඳහා දක්වා ඇති නිශ්චිත කාලසීමාවක් තුල කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්විය යුතු වුවත් විගණිත දිනය වූ 2024 ජුනි 13 දින වන විටත් කාර්යක්ෂමතා විභාග පවත්වා නොතිබුණු අතර සේවකයන් ස්ථිර කිරීමේදී හා උසස් කිරීමේදී කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කර තිබේද යන්න සැලකිල්ලට ගෙන නොතිබුණි.	මේ වන තෙක් බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටියෙහි සඳහන් පරිදි කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම අනිවාර්ය නොවන බැවින් ආයතනය සතුව කාර්යක්ෂමතා කඩඉම් විභාග ක්‍රමවේදයක් ස්ථාපිත කර නොමැත.	බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කටයුතු කළ යුතුය.